*සැ. යු.*– 2007.11.30 වැනි දින පළකරන ලද අංක 1,526 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,527 - 2007 දෙසැම්බර් මස 07 වැනි සිකුරාදා - 2007.12.07**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1414 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 1412 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1417 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*– (i) කාර්මික ආරාවුල් (සංශෝධන) පනත් කෙටුම්පත 2007 ඔක්තෝබර් මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ* අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2007 ඔක්තෝබර් මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ* අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දණ්ඩනීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2007 ඔක්තෝබර් මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ* අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සැහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 දෙසැම්බර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 නොවැම්බර් මස 30 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## අනුරාධපුර පොලිස් අධිකාරී කොට්ඨාසය

### ගර්හිත භාණ්ඩ වෙන්දේසිය

අනුරාධපුර පොලිස් අධිකාරී කොට්ඨාසයේ පාවිච්චියෙන් ඉවත් කරන ලද පහත සඳහන් භාණ්ඩ 2007.12.15 වන දින අනුරාධපුර පොලිස් භූමියේ දී පැය 1000 ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අදාළ ගර්හිත භාණ්ඩ පරීක්ෂා කිරීම 2007.12.14 වන දින පැය 1600ට අනුරාධපුර පොලිස් භූමියේ සිදු කළ හැකිය. වෙන්දේසි භූමියට ඇතුල් වීමේදී තම අනන්‍යතාවය සහතික කිරීම සඳහා පුද්ගලික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

වෙන්දේසියෙන් ලබා ගන්නා ලද භාණ්ඩ වෙනුවෙන් එදිනම මුදල් ගෙවා පොදු 172 පෝරමය ලබා ගත යුතු අතර භාණ්ඩ එදිනම පොලිස් භූමියෙන් ඉවත් කර ගත යුතුය. ඉවත් කර නොගන්නා භාණ්ඩ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

ඊ. කේ. බී. මැකර්ති පෙරේරා,
කොට්ඨාස භාර පොලිස් අධිකාරී,
අනුරාධපුර කොට්ඨාසය.

2007 නොවැම්බර් මස 16 වැනි දින,
පොලිස් අධිකාරී කාර්යාලය,
අනුරාධපුරය.

| අනු අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | ටියුබ් බල්බ් සෙට් | 26 |
| 02. | ලැන්තැරුම් | 05 |
| 03. | විදුලි සීනු | 01 |
| 04. | ඉබි යතුරු | 06 |
| 05. | උදලු තල | 12 |
| 06. | ගෑස් කුකර් | 03 |
| 07. | ගුවන් විදුලි යන්ත්‍ර | 01 |
| 08. | ගිනි නිවන උපකරණ | 04 |
| 09. | නැබිලි | 03 |
| 10. | තණ කොළ කපන මැෂින් | 01 |
| 11. | පන්වර් ලොකු | 01 |
| 12. | පීඩන ලාම්පු | 05 |
| 13. | මේස පිහියා | 04 |
| 14 | මල්ටි පොට් | 02 |
| 15 | මේගා පෝන් | 01 |
| 16 | මේගා ලයිට් | 01 |
| 17. | යකඩ ඇඳන් ද්විත්ව | 13 |
| 18. | යකඩ ඇඳන් තනි | 13 |
| 19. | මේස් ටින් | 61 |
| 20. | යකඩ පුටු | 43 |
| 21. | යතුරු ලියන ඉංග්‍රීසි | 01 |
| 22. | යතුරු ලියන සිංහල | 03 |
| 23. | යතුරු ලියන මේස | 01 |
| 24. | යකඩ පෙට්ටි | 01 |
| 25. | යකඩ දම්වැල් | 01 |
| 26. | රූපවාහිනී යන්ත්‍ර වර්ණ | 04 |
| 27. | රේක්ක | 01 |
| 28. | විදුලි පන්කා සිවිලින් | 04 |
| 29. | විදුලි පන්කා රෙගියුලේටර් | 20 |
| 30. | අධි ශීතකරණ | 03 |
| 31. | සාස් පාන් කුඩා | 05 |
| 32. | හැලජන් ලාම්පු සෙට් | 82 |
| 33. | කරකවන හිරමනා | 18 |
| 34. | විදුලි හිරමනා | 02 |
| 35. | හදිසි විදුලි පහන් | 01 |
| 36. | වීල් බැරෝ | 01 |
| 37. | විසි කැති | 03 |
| 38. | කල්දේරම් | 60 |
| 39. | පාපැදි පිරිම් | 38 |
| 40. | පොරෝතල | 11 |
| 41. | ෆැක්ස් යන්ත්‍ර | 01 |
| 42. | කැසට් රේඩියෝ | 04 |
| 43. | කරාම | 05 |
| 44. | බාල්දි ලොකු, කුඩා | 41 |
| 45. | බන්ඩි කියත් | 03 |
| 46. | බෙන්ඩර් | 01 |
| 47. | වතුර පිල්ටර් | 36 |
| 48. | විදුලි පන්දම් | 23 |
| 49. | විදුලි කේතල් | 07 |
| 50. | වතුර ටැංකි ගැල්වනයිස් | 04 |
| 51. | වතුර මෝටර් (විදුලි) | 03 |
| 52. | මේස විදුලි පංකා | 07 |
| 53. | විදුලි වතුර බොයිලේරු | 14 |
| 54. | ටියුබ් බල්බ් සෙට් අඩි 04 | 04 |
| 55. | වො. 1000 හැලජන් ලාම්පු | 06 |

12-112

---

## හෝමාගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හෝමාගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද, හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි පහත සඳහන් භාණ්ඩ 2007.12.22 දින පෙ.ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර, සියළුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙනදේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ජී. එස්. එදිරිසිංහ,
දිසා විනිසුරු,
හෝමාගම.

2007 නොවැම්බර් මස 21 වෙනි දින,
හෝමාගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දීය.

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | 11070 | | අත් ඔරලෝසු | 01 |
| 02. | 16119 | | කැසට් රේඩියෝ | 01 |
| 03. | 16878 | | කැසිනෝ අත් ඔරලෝසුව | |
| 04. | 16898 | | අත් ඔරලෝසු | 01 |
| 05. | 18824 | | යතුරු තහඩු | |
| 06. | 18826 | | සිටිසන් වර්ගයේ අත් ඔරලෝසුවක් | |
| 07. | 24766 | | විදුලි ස්ත්‍රික්ක | 01 |
| 08. | 25726 | (i) | සාරි | 01 |
| | | (iv) | අත් ඔරලෝසු | 01 |
| 09. | 28145 | | ෆ්ලෑෂ් ලයිට් | 01 |
| 10. | 28150 | | කරාම | 01 |
| 11. | 28197 | | කුඩා ගෑස් සිලින්ඩරයක් | |
| 12. | 28338 | | යකඩ කැබැලි අඩංගු පොහොර උරය | |
| 13. | 30207 | | ටී ෂර්ට් | 01 |
| 14. | 42758 | | කැසට් යන්ත්‍ර | 01 |
| 15. | 43153 | | රේඩියේටර් | 01 |
| 16. | 45547 | | ඩෙක් යන්ත්‍ර | 01 |
| 17. | 44018 | (i) | ප්ලාස්ටික් පුටු | 06 |
| | | ii) | බිත්ති ඔරලෝසු | 01 |
| 18. | 45410 | (i) | ඉමිටේෂන් වළලු | 06 |
| | | (ii) | මල්පෙති සහිත ඉමිටේෂන් වළලු | 04 |
| | | (iii) | බුබුළු මල් සහිත ඉමිටේෂන් වළලු | 02 |
| | | (iv) | ඉමිටේෂන් ඉති කරාබු ජෝඩු | 01 |
| | | (v) | ඉමිටේෂන් ප්ලේන් වළලු | 02 |
| | | (vi) | සුදු ගල් අල්ලන ලද පෙන්ඩන | 01 |
| | | (vii) | මල් පෙති අත් පළඳනා | 01 |
| | | (viii) | ඉමිටේෂන් කර මාල | 01 |
| | | (ix) | ඉමිටේෂන් තෝඩු | 02 |
| | | (x) | අත් පළඳනා කිහිපයක් | 01 |
| 19. | 47226 | | වතුර මෝටර | 01 |
| 20. | 47966 | | සිවිලිං විදුලි පංකා (පෙති රහිත) | 02 |
| 21. | 47967 | | සිවිලිං විදුලි පංකා (පෙති රහිත) | 01 |
| 22. | 51250 | | යතුරු පැදියක වැසි කොටස හා අමතර කොටස් | 02 |
| 23. | 53511 | | රතු පාට ගෑස් සිලින්ඩර | 01 |
| 24. | 54469 | | වතුර මෝටර | 01 |
| 25. | 56113 | | පොකට් රේඩියෝ | 01 |
| 26. | 56558 | | තරාදි | 01 |
| 27. | 57103 | (i) | ස්ටෙන්සිල් පැකට්, කපුරු බෝල, කුඩ, ඉබි යතුරු, නිකල් ප්ලේට් පිහි, පෑන් ආදිය අඩංගු පොහොර උරය | |
| | | (ii) | කැමරා | 01 |
| 28. | 63733 | (i) | කැසට් රේඩියෝ | 01 |
| | | (ii) | වාහන ලාම්පු කට්ටල | 02 |
| | | (iii) | රන් පැහැති පෑන් | 01 |
| | | (iv) | අලුපාට මුදල් පසුම්බි | 01 |
| 29. | 66328 | (i) | විදුලි ස්ත්‍රික්කයක් සහ ඇඳුම් කිහිපයක් | |
| | | (ii) | කැසට් රේඩියෝ | 01 |
| | | (iii) | ඔරලෝසු | 01 |
| 30. | 69132 | | රේඩියේටර් කැබැලි අඩංගු පොහොර උරය | |
| 31. | 70310 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 32. | 72580 | | 4" x 3" විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් කොස් ලී කැබැලි කිහිපයක් | |
| 33. | 74307 | | ඕවලොක් මැෂින් | 01 |
| 34. | 75544 | (i) | වර්ණ රූපවාහිනී | 01 |
| | | (ii) | යකඩ පතුරු අඩංගු පොහොර උර | 01 |
| 35. | 76760 | | පස් තලන මැෂින් | 01 |
| 36. | 77863 | | අත් ඔරලෝසු | 01 |
| 37. | 78871 | (i) | වී. සී. ඩී. යන්ත්‍ර | 01 |
| | | (ii) | විදුලි ස්ත්‍රික්ක | 01 |
| 38. | 78081 | | ගැල්වනයිස් බට තොගයක් | |
| 39. | 81402 | | බැරල් තොගයක් | |
| 40. | 83997 | | කාබලේටර් | 01 |
| 41. | 86132 | (i) | ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | ගෑස් ලිප් | 01 |
| 42. | 86744 | (i) | ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | ගෑස් ලිප් | 01 |
| 43. | 87159 | (i) | ගෑස් සිලින්ඩර | 01 |
| | | (ii) | ගෑස් ලිප් | 01 |
| 44. | 88166 | (i) | කහපාට ගෑස් සිලින්ඩර | 01 |
| | | (ii) | ගෑස් ලිප් | 01 |
| 45. | B 2187 | | යකඩ කැබැලි අඩංගු පොහොර උරය | |
| 46. | B 4222 | | කටර් අඬු අඩංගු කාඩ්බෝඩ් පෙට්ටිය | |
| 47. | B 4702 | | විදුලි පංකා | 01 |
| | | | රෙගුයුලේටර් | 01 |
| | | | ඩෙක් | 01 |
| 48. | B 5377 | | වයර් රෝල් හා ප්ලග් 07 ක් අඩංගු පෙට්ටිය | |
| 49. | B 6204 | | ඊතල මිටිය | |
| 50. | B 8222 | | අබලන් ගෑස් ලිපක කොටසක් | |
| 51. | B 8258 | | අබලන් වතුර ටැංකි | 01 |
| 52. | AR2062 | | අත් ඔරලෝසුවක් | |
| 53. | AR6025 | | රන් පැහැති අත් ඔරලෝසු | 01 |
| 54. | AR6151 | | පාපැදි | 01 |
| 55. | AR6717 | | අකායි වර්ගයේ කැසට් රේඩියෝ | 01 |
| 56. | AR6789 | (i) | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | (ii) | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 57. | AR6988 | | ඔක්සිජන් සිලින්ඩර් | 02 |
| 58. | AR7298 | (i) | යකඩ බාල්දි | 07 |
| | | (ii) | උදළු | 02 |
| 59. | 47564 | | යතුරු පැදි කණ්ණාඩි | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 60. | B/5040 | බණ්ඩි කියත් | 01 |
| 61. | අංක රහිත | ග්‍රීස් පොම්ප | 01 |
| 62. | AR6367 | 117-3366 වැලි | 01 |
| 63. | අංක රහිත | වාහන කොටස්(යකඩවලට) | |
| 64. | AR3836 | රන් පෙන්ඩන් | 01 |
| 65. | AR3836 | රන් කරාබු | 02 |
| 66. | AR3836 | රන් කරාබු | 02 |
| 67. | AR3836 | රන් කරාබු | 02 |
| 68. | AR3839 | රන් කරාබු | 02 |
| 69. | 14660 | රන් කරාබු | 02 |
| 70. | 27762 | රන් මුදු | 01 |
| 71. | අංක රහිත | දහර යකඩ කුරු මිටිය | |
| 72. | අංක රහිත | පලංචි බාර් | 35 |
| 73. | අංක රහිත | ගෙවී ගිය ටයර් | 01 |
| 74. | අංක රහිත | ගෙවී ගිය යතුරු පැදි ටයර් | 01 |
| 75. | අංක රහිත | සවල් තල | 01 |
| 76. | අංක රහිත | වාහනේ දොර පලුවක් | |
| 77. | අංක රහිත | ඇලුමිනියම් කම්බි පොහොර උර | 01 |
| 78. | අංක රහිත | බයිසිකල් කෑබැලි සහ දිරාගිය යතුරු පැදියක කොටසක් | |
| 79. | අංක රහිත | රබර් රොටි අඩංගු පොහොර උර | 01 |
| 80. | අංක රහිත | අබලන් බාල්දි | 01 |
| 81. | අංක රහිත | යකඩ කෑබැලි අඩංගු පොහොර උර | 01 |
| 82. | අංක රහිත | යකඩ ඩ්‍රම් | 02 |
| 83. | අංක රහිත | සවල් | 01 |
| 84. | අංක රහිත | මෝටර් | 01 |
| 85 | අංක රහිත | ගස් බඳින කම්බි වැනි කුඩා රෝල් | 01 |
| 86 | අංක රහිත | පැදුරු | 02 |
| 87 | අංක රහිත | බිත්ති ඔරලෝසු | 01 |
| 88 | අංක රහිත | පොහොර උර කිහිපයක් | |
| 89 | අංක රහිත | ඇම්ලිපයර් | 01 |
| 90 | PR 119 | අත් ඔරලෝසු | 01 |
| 91 | PR 119 | වී. සී. ඩී. තැටි කවර අඩංගු පෙට්ටි | 01 |
| 92 | PR 119 | බස් රථයක තහඩු කෑබැලි කිහිපයක් | |
| 93 | PR 119 | ඇළුමිනියම් කේතල් | 01 |
| 94 | PR 119 | අබලන් කැමරාවක්, සිටිසන් අත් ඔරලෝසුවක්, විදුලි පන්දමක්, අබලන් ඇස් කණ්නාඩියක්, නැෂනල් පැනසොනික්, අබලන් රේඩියෝවක්, සොනෝකා වර්ගයේ රේඩියෝවක්, විදුලි සීනුවක්, හා ඔරලෝසුවක් අඩංගු පෙට්ටිය | |
| 95 | PR 119 | රේඩියේටර් | 01 |
| 96 | PR 119 | නල ළිඳක යාන්ත්‍රික කොටස | |
| 97 | PR 119 | උදළු | 03 |
| 98 | PR 119 | යකඩ පුටු | 02 |
| 99 | PR 119 | උණු වතුර බෝතල් | 01 |
| 100 | PR 119 | අබලන් බාල්දි | 04 |
| 101 | PR 119 | යකඩ රවුම් (වාහන අමතර කොටස්) | 03 |
| 102 | PR 119 | වඩු කරාම | 01 |
| 103 | PR 119 | අබලන් ෆෑන් | 01 |
| 104 | PR 119 | නමන පුටු | 01 |
| 105 | PR 119 | ට්‍රිප් ස්වීච් | 01 |
| 106 | PR 119 | පඩික්කන් | 01 |
| 107 | PR 119 | එස්ලෝන් බට කැබලි | 01 |
| 108 | PR 119 | වාහනයක සයිලන්සර් | 01 |
| 109 | PR 119 | යකඩ වලින් සෑදූ චතුස්‍රාකාර කූඩු | 01 |
| 110 | PR 119 | හෙඩ් ලයිට් 3ක් අඩංගු කවරය | |
| 111 | PR 119 | ටයිල් අඩංගු පොහොර උරය | |
| 112 | PR 119 | උදළු තල 2ක් හා යකඩ ෆ්‍රේම් 1 අඩංගු පොහොර උරය | |
| 113 | PR 119 | යකඩ කෑබැලි අඩංගු පොහොර උරය | |
| 114 | PR 119 | වාහන දොරවල් | 04 |
| 115 | PR 119 | බලු කූඩු | 01 |
| 116 | PR 119 | යකඩ ගේට්ටු | 01 |
| 117 | PR 12 | යකඩ ෆ්‍රේම් | 01 |
| 118 | PR 159 | ගල් කටු | 01 |
| 119 | PR 182 | සුදු රෙදි පීස් කොටසක් සහ රතු රෙදි කොටසක් | |
| 120 | PR 178 | වයර් කෑබැලි, ට්‍රිප් ස්වීච් 1 සහ ස්වීච් බෝඩ් 1 ක් ආදිය අඩංගු පොහොර උර | 01 |

12-148

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

තලවතුගොඩ, වැලි පාරේ අංක 502 දරන ස්ථානයේ පදිංචි හෝල්ලුපතිරගේ ප්‍රේමතිලක කල්දේරා වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නුරානි අමරසිංහ විසින් ලියා සහතික කළ අංක 70 සහ 2006.09.07 වන දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මාගේ ඇටෝර්නි බලකාරිය ලෙස තලවතුගොඩ, වැලි පාරේ, අංක 502 දරන ස්ථානයේ පදිංචිව සිටි දැන් පොල්ගස්ඕවිට, මත්තේගොඩ, පුබුදු මාවත හි අංක 38/1 දරන ස්ථානයේ පදිංචි පැලැන් වත්තගේ නිරෝෂිණී පෙරේරා යන අය පත් කරන ලදී. එකී ඇටෝර්නි බලපත්‍රය මා විසින් අවලංගු කර ඇති බවත්, එකී ලේඛනය මෙවක් පටන් කිසිදු බලපැවැත්මක් නොවන බවද ශ්‍රී ලංකා ජනරජයටත්, සියලු පුරවැසියන්ටත් මෙයින් දන්වා සිටිමි.

12-10

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1. සමාගමේ නම : සීමාසහිත රත්නාලෝක ඉන්ටර්නැෂනල් (පුද්ගලික)
2. සමාගමේ අංකය : පී. වී. 61719
3. ලියාපදිංචි කාර්යාලය : අංක 84, පුත්තලම් පාර, කුරුණෑගල
4. සංස්ථාගත කළ දිනය : 2007.10.17

ලේකම්,
සීමාසහිත රත්නාලෝක ඉන්ටර්නැෂනල් (පුද්ගලික).

2007 නොවැම්බර් මස 20 වැනි දින.

12-97

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 07, කින්සි පාර, අංක 68 හි පදිංචි ඉර්මා මහේෂ්වරී පෝල් වන මා විසින් ඇමරිකා එක්සත් ජනපදයේ ට්‍රේල් ජැක්සන් විල් FL32256 බර්න්ට් ක්වැක්, අංක 7739 හි පදිංචි සිවන්ත රාජකුමාර් ජයරාජන් පෝල්, ඕස්ට්‍රේලියාවේ, වික්ටෝරියා 3126, කැන්ටබරි, රොචෙස්ටර් පාරේ, අංක 28 හි වෛද්‍ය ශිකන්දනී ඩයිටා ජෝෂප්, ඕස්ට්‍රේලියාවේ, වික්ටෝරියා 3150, ග්ලේන් වැනර්ලි ස්ප්‍රිංග්වේල් පාරේ, අංක 139 හි පදිංචි අමර්ජිත් ජස්වන්ත් පෝල් සහ ඕස්ට්‍රේලියාවේ නිව්සවුත්වේල්ස් 2076, වාරුංගා, වාරුංගා ඇවනිව්, අංක 14 හි අවින්ද්‍ර ශ්‍රීදර් පෝල් යන අයට ප්‍රදානය කර ඇති කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. තෝමස් මහත්මියගේ 2001.10.12 දිනැති අංක 589 දරන සාමාන්‍ය ඇටෝර්නි බලපත්‍රය මෙහි දින සිට අවලංගු වී, අහෝසි වී, බල රහිත වන අතර එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ඉර්මා මහේෂ්වරී පෝල්.

12-11

---

## 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ හෙලංකා වැකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

වර්ෂ 2007 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින
සංස්ථාගත කරනු ලැබූ බවට වන සංස්ථාගත කරනු ලැබීමේ දැනුම්දීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තියට අනුව සමාගමේ නාමය, සමාගමේ අංකය සහ සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ නාමය | : | හෙලංකා වැකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | පී. වී. 61942 |
| සමාගමේ ලිපිනය | : | ලෙවල් 6, ඇක්සස් ටවර්ස්, අංක 278, යූනියන් පෙදෙස, කොළඹ 02. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ආර්.සෙක්‍රටේරියල් සර්විසස්(ප්‍රයිවෙට්) ලිමිටඩ්.
අධ්‍යක්ෂ.

12-27

## දැන්වීමයි

තාරක ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 නොවැම්බර් 09 වන දින සංස්ථාගත කරන ලද බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | තාරක ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | පී. වී. 61965 |
| ලියාපදිංචි කාර්යාලය | : | අංක : 15/C, 01 වන පටුමග, පාගොඩ පාර, නුගේගොඩ. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රෝව්ලි මැනේජ්මන්ට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

12-85

---

## දැන්වීමයි

2007 නොවැම්බර් මස 09 වැනි දින මාස් රිසර්ච් ඇන්ඩ් ඉනොවේෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම සංස්ථාගත කරන ලද බව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | |
|---|---|
| සමාගමේ නම | : මාස් රිසර්ච් ඇන්ඩ් ඉනොවේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : පී. වී. 61964 |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : අංක 75, හේමාස් නිවස, 10 වැනි මහල, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මාස් රිසර්ච් ඇන්ඩ් ඉනොවේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරුන් වන,
කෝපරේට් සර්විසස් ලිමිටඩ්.

12-79

---

## සමාගමක් සංස්ථාගත කිරීමට අදාළ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීම

| | |
|---|---|
| සමාගමේ නම | : සහය කෝපරේට් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් |
| සමාගමේ ලියාපදිංචි අංකය | : PV 62019 |
| සංස්ථාගත කළ දිනය | : 2007 නොවැම්බර් 14 වැනි දින |
| ලියාපදිංචි කාර්යාලය | : අංක 23ජ් 1/1, සුලෙයිමාන් ඇවනියු, කොළඹ 5. |

සමාගමේ ලේකම්.

12-139

## සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය

සමාගමේ නම : ජුපිටර් ට්‍රේඩිං ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 62056
සංස්ථාගත කළ දිනය : 2007.11.16
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 101, හතර වන මහල, ශ්‍රී කදිරේෂන් වීදිය, කොළඹ 13.

සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්ගලික)
ලේකම්වරු.

2007 නොවැම්බර් මස 20 වැනි දින,
අංක 96-2/2, මල්වත්ත පාර,
කොළඹ 11.

12-135

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

හලාවත, කුරුණෑගල පාර,අංක 125හි පදිංචි ශ්‍රී ලංකා හේවගේ වරුණ චන්ද්‍රලාල් රත්නප්‍රිය (වර්ණකුලසූරිය පෝරුතොටගේ සනත් රෝහන් ක්ලිෆඩ් ප්‍රනාන්දු යන අයගේ ඇටෝර්නි බලකරු ලෙසට පෙනී සිටිමින්) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. චන්ද්‍රසේන මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1625 සහ 2001.09.04 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් එහි සඳහන් කාර්යයන් ඉටුකිරීම පිණිස බංගදෙනිය දෙමටපිටිය පදිංචි සිංහකුට්ටි මුදියන්සේලාගේ කරුණාවතී යන අයට දෙන ලද බලය 2007.07.20 අවලංගු කරන ලද බව මහජනයාට මෙයින් දන්වන අතර මින් ඉදිරියට ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මම වග නොකියන බව ද මෙයින් දන්වා සිටිමි.

වරුණ චන්ද්‍රලාල් රත්නප්‍රිය.

2007 සැප්තැම්බර් මස 29 වැනි දින,

12-145

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම

ලියාපදිංචි අංක **P. V.** 61872 දරන ටොයොන් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, 2007 නොවැම්බර් 01 වැනි දින සංස්ථාගත කරනු ලැබ ඇත. සමාගම් ලියාපදිංචි කාර්යාලය අංක 29/2, ග්‍රීන්ෆීල්ඩ් පාක්, මාදිවෙල, කෝට්ටේ හි පිහිටියේ ය.

සමාගමේ ලේකම්.

12-146

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පහත දැක්වෙන සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඒ. ටී. විෂන් (පෞද්ගලික)සමාගම
සමාගමේ අංකය : පී. වී.61788
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 725, සෝන් - 2, මිලේනියම් සිටි, අතුරුගිරිය
ලියාපදිංචි කළ දිනය : 2007.10.23

12-136

---

## ඇටෝර්නි බලය ආපසු කැඳවා අවලංගු කිරීම

සියලු දෙනාගේම දැන ගැනීම පිණිස

දෙහිවල, අත්තිඩිය ප්‍රධාන පාරේ, අංක 323/**A** හි, පදිංචි රූපසිංහ ආරච්චිගේ දොන් සුනිල් අශෝක වන මම ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එල්. ජේ. විජේසිංහ මහතා විසින් වර්ෂ 2006 ඔක්තෝබර් මස 31 සහතික කර ඇති ඇටෝර්නි බල පත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් රංගලා දීවානී දබෝරගම පත්කර තිබූ ඇටෝර්නි බලය අද පටන් මින් අවලංගු කරමි. එබැවින් අද පටන් එකී ඇටෝර්නි බලකාරිය විසින් කරන කිසිම කටයුත්තකට රූපසිංහ ආරච්චිගේ දොන් සුනිල් අශෝක වන මම වග නොකියන බව මෙයින් සියලු දෙනාටම දැනුම් දෙමි.

රූපසිංහ ආරච්චිගේ දොන් සුනිල් අශෝක.

2007 නොවැම්බර් මස 20 වැනි දින.

12-113

---

## සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව අප විසින් මෙයින් දන්වා සිටිමු.

සමාගමේ නම : යස්මීන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 61937
සමාගම් ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 20, ජයපුර, කොට්ටාව
සංස්ථාගත කරන ලද දිනය : 2007.11.06.

යස්මීන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

12-124

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කුරුණෑගල තැපැල්, විල්බාව, අංක 113 හි පදිංචි චන්ද්‍රසේකර මුදියන්සේලාගේ මල්ලිකා මැණිකේ වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරයේ 07 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

සී. එම්. එම්. එම්. මැණිකේ,
ප්‍රතිඥාත නොතාරිස් ලිපිකරු.

12-55

## ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 06, ස්ටැෆර්ඩ් ඇවනිව්, අංක 12 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 460011214IV දරන නසීර් හුසේන් ගනී වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අසාඩ් රහිම් ලියා සහතික කරන ලද අංක 2703 සහ 1981 ජුනි 27 දරන කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ 287 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද මොහෙමඩ් මුආස් මොහිදීන් මුබාරක් වෙත පවරන ලද ඇටෝර්නි බලය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන බව ශ්‍රී ලංකා ආණ්ඩුවට සහ මහජනතාවට මෙයින් දැනුම් දෙන අතර මින් ඉදිරියට ඉහත කී ඇටෝර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවකට, බලයකට හිමිකම් ඔප්පු කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

එන්. එච්. ගනී.

12-45

## ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

ඇල්පිටිය, නවදගල, අටකොහොට 370/14/1 දරන සඳකැළුම් හි පදිංචිව සිටි මග්ගොන මාගල්කන්ද, බූසාබදුගේ කුරුදුවත්ත, අංක 251 එල්/1 දරන ස්ථානයේ පදිංචි කළුපෙරුම හර්ෂිකා දිල්රුක්ෂි ද සිල්වා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ ජනරජයේ සියළුම මහජනයාට දන්වා සිටින වග නම්.

නවදගල, අටකොහොට, සඳකැළුම් හි පදිංචි බාලහෙට්ටි ජයසිංහ යන අයට බලය පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් මුනිදාස හාල්පන්දෙනිය හේවගේ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 853 සහ 2007.07.11 දින දරන ඇටෝනි බලපත්‍රය අද දින සිට එනම් 2007.10.03 දින සිට අවලංගු සහ බලරහිත වන බවද, ඔහු විසින් ඇතුළත් වනු ලබන කිසිදු ගනුදෙනුවක හෝ ලියවිල්ලක බලපැවැත්මක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

කළුපෙරුම හර්ෂිකා දිල්රුක්ෂි ද සිල්වා.

12-89

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - අලුත්කඩේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2004.10.07 දින සහ අංක 2225 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙලප්පු නයිදෙලාගේ ලිලාන් සම්පත් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2007 දෙසැම්බර් මස 27 වන දින පෙ.ව. 11.00ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඩුවෙල ඒකකයේ මාලඹේ පිහිටි පොල්ගස්මේලන්ද නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක පී. එෆ්. ඩයස් විසින් මැන සාදන ලද 2002.08.04 දිනැති අංක 1552 සී දරන පිඹුරේ බෙදා වෙන් කර විස්තර කරන ලද ලොට් සී දරන ඉඩම් කොටස සහ අංක 2225 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති මාර්ග අයිතියද, සමග වේ.

*විශාලත්වය* : පර්චස් 10.80.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.09.21 දින දරන *ගැසට් පත්‍රය* හා 2007.10.11 වන දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : -

වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද;
2. ප්‍රාදේශීය බදු සඳහා සියයට එක (1%) ක් ද;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද;
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය(රු. 500) ක්ද;
5. සියලුම ප්‍රචාරක වියදම්;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහ (රු.2,000) ක් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්) සීමාසහිත හැටන් නැෂනල් බැංකුව අංක 479 ටී. බී. ජායා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබා ගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121

12-108/1

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - තිඹිරිගස්යාය ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. පී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 2003.07.03 දිනැති අංක 588 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කමල් නීල් සේනක සිදන්ත රත්වත්තේ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්. සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා ලත් බලය මත පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේ දී 2007 දෙසැම්බර් මස 28 වන දින පෙ. ව. 10.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝකන්දර පිහිටි “වෙල්ලන්ගිරිය එස්ටේට්” නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද 1999.11.08 දිනැති අංක 1657 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 32 දරන ඉඩම සහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් ලියා සහතික කරන ලද 2003.07.03 වන දිනැති අංක 588 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ විස්තර වන මාර්ග අයිතිය ද සමඟ වේ. විශාලත්වය පර්චස් 10.71යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.10.13 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2006.10.26 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* .–වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක්ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙක හමාරක් (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, තිඹිරිගස්යාය ශාඛාව (දුරකථන අංක-4519862/ 2582606) හෝ කොළඹ 10. ටී. බී. ජයා මාවත, අංක 479, ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු, (ණය අයකිරීම්) දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබා ගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිට කෝට්ටේ,
කෝට්ටේ.

දුරකථන අංක : 2863121

12-108/2

---

## රුහුණ සංවර්ධන බැංකුව - තල්ගස්වල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2007.12.27 දින පෙ.ව. 11.30ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස් කර ඇති දේපල පිළිබඳ විස්තරය*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ගහබඩපත්තුව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝනලගොඩ පිහිටි අගපි 613 දරන පිඹුරේ අංක 72 BQ දරන ඌරමුල්ලකන්ද නමැති අක්කර එකයි පර්චස් හතක් (අක්. 01, රූ. 0, පර්. 07) ක් විශාල ඉඩම එහි ඇති තේ වැවිල්ල ඇතුළු සියලු දේද වේ.

වැඩි විස්තර සඳහා 2005.09.09 දින රජයේ *ගැසට් පත්‍රයද* 2005.10.07 දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත්වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* :- මාපලගම සිට කි. මී. 1/2 ක් ගිය විට තල්ගස්වල සිට ගෝනගලගොඩට හැරෙන හන්දිය හමුවේ. එතැනින් වමට ඇති ගෝනලගොඩ පාරේ කි. මී. 03 ක් පමණ ගිය විට ගම්මැද්දෙගොඩ ගම හමුවේ. එතැනින් දකුණට ඇති පස් පාරේ කි. මී. 1/2 ක් පමණ ගිය විට මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.– වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 25% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිළෙන් 1% ක්ද
3. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්ද,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදලද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවත, අංක 382ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සභාපතිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 091-2222458

ජී. පී. ආනන්ද,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුදුවත්ත, වල්ගම, මාතර,
දුරකථන අංකය 041-2228731

12-25

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - මෝදර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, බලයලත් මානක ජී. ඩබ්ලිව් ද සොයිසා විසින් 1923 සැප්තැම්බර් මස 15 වන දින සාදන ලද පිඹුරු අංක 26 හි නැවත මැනීමක් වූ ලොට් "ඒ" හි ඇති ගොඩනැගිලි, සහ වැව්ලි සහිතව බෙදා වෙන් කරන ලද ඉඩම බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහ නගර සභා සීමාව තුළ මෝදර කොට්ඨාස 2 හි පිහිටි කේ. සිරිල් සී. පෙරේරා මාවතේ (පෙරදී බ්ලූමැන්ඩල් පාර ලෙස) හඳුන්වනු ලබන වරිපනම් අංක 732 ට මායිම් පර්චස් දොළහයි දශම නවයයි බිංදුවක් (අ.0, රූ. 0, පර්. 12.90) විශාල වූ ඉඩම හුසන් මොහමඩ් රහිමා බෙගම් *හෙවත්* හසන් මොහමඩ් රහිමා බෙගම් සහ මොහමඩ් සිද්දික් කහජා නජිමුදීන් ණයකරුවන්/උකස් කරු හැටියට ද, ඔවුන් විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කල දේපළ, වර්ෂ 2007 ක් වූ දෙසැම්බර් මස 28 වන දින පෙ.ව.11.00 ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.02.23 දින *රජයේ ගැසට් පත්‍රය* ද සහ 2007.02.26 වන දිනැති දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් පත්‍ර ද විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2007.12.07 දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2007.12.07 දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් පත්‍ර ද බලන්න.

*ඉඩමට පිවිසීම*.– කොළඹ කොටුවේ සිට පිටකොටුව හරහා මහා විද්‍යාල මාවත, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත කේ. සිරිල් සී. පෙරේරා මාවත ඔස්සේ ඉහත දේපළ හමුවන තෙක් ඉදිරියට යන්න.

*ගෙවීමේ ක්‍රමය*.– විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%);
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (01%);
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිළෙන් සියයට දෙකයි දශම පහයි (2.5%);
4. නොතාරිස් ගාස්තු රු. 2000;
5. ලිපිකරු සහ ඝෝෂක වේතනය රු. 500;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්;
7. ගැනුම් මිළෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළතදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ හෝ මෝදර ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

*කළමනාකරු*;
කොමර්ෂල් බැන්ක් ඔෆ්
සිලෝන් ලිමිටඩ්,
අංක 677,
අලුත්මාවත
පාර, කොළඹ 15.

දුරකථන අංක : 2522559
2467057
2522553
ෆැක්ස් අංක : 2522557

එල්. බී. සේනානායක මහතා,
සාම විනිසුරු, තක්සේරුකරු,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
කොළඹ දිසා අධිකරණය සහ කොළඹ වාණිජ්‍ය මහාධිකරණය, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක : 99 උසාවි පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 2445393

12-114

---

## ඩී. එෆ්. සී. සී. බැංකුව
## (පෙර ලංකා සංවර්ධන මුදල් සංස්ථාව)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 8 වන වගන්තිය යටතේ වෙන්දේසි කිරීම

බලයලත් මානක ජී. එච්. ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද 1961.07.09 දින දරන අංක 1865 පිඹුර දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ, නැගෙනහිර අහංගම ගොයියාපානේ පිහිටි දෙහිගහවත්ත නමැති ඉඩමේ බෙදා වෙන්කරන ලද බිම් කොටස ලොට් අංක 06, ප්‍රමාණය අ. 0, රූ. 1 පර්. 9.6 (එහි තුළ ඇති ගොඩනැගිලි වැව්ලි සහ වෙනත් දේ සමග වේ.) බලයලත්

මානක ඒ. ආර්. වීරසූරිය විසින් මැන සාදන ලද 1995.07.15 දින දරන අංක 856 පිඹුර, දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ, අහංගම ගොයියාපානේ වත්තෙ ලොට් අංක 03න් ලොට් අංක 1ඒ සහ 1බී දරන බිම් කට්ටිය සහ බෙදා වෙන්කල ලොට් "ඒ" දරන ඒකාබද්ධ බිම්කට්ටිවලට සාදන ලද පිඹුරේ පෙන්නුම් කර තිබෙන ලොට් "ඒ" අ. 0, රූ. 0, පර්. 10.45පර්චස් දහයයි දශම හතරයි පහයි. (එහි තුළ ඇති ගොඩනැගිලි වැවිලි සහ වෙනත් දේ සමග වේ). අහංගම වරින්දු එන්ටර්ප්‍රයිසස් යන නාම විලාශයෙන් සහ අභිධානයෙන් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලයනල් ඉප්පලවත්ත විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද දේපල. ඩී. එෆ්. සී. සී. බැංකුව මගින් මා වෙත පරවන ලද බලතල අනුව වර්ෂ 2007ක් වූ දෙසැම්බර් මස 27 වන දින පෙ. ව. 11.30ට ආරම්භකර එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි ( 2.5%),
4. නොතාරිස් ගාස්තු රු. 2000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ධ තීරු බද්ද හෝ වෙනත් බදු ගෙවීම් නිකුත්කළ දින සිට දින 30ක් ඇතුළත දී ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති නිලධාරි අමතන්න. දුරකථන අංක : 011-2440366.

ගාමිණී බී. එස්. දියාව,
වෙන්දේසිකරු තක්සේරුකරු සහ බ්‍රෝකර්වරු.

අංක 247, ප්‍රීතිපුර පාර, පල්ලිය වත්ත, හැඳල, වත්තල.
දුරකථන අංක : 0777281723.

12-151

---

## නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ කෙරෙන වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

### පී. එල්. සී. ප්‍රසිද්ධ වෙන්දේසිය ඉතාමත් වටිනා දේපල

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. සුබසිංහ විසින් ලියා සහතික කරන ලද 2006 ජනවාරි 04 දිනැති අංක 2469 දරන උකස්කරය මත, නුවර මාවිල්මඩ, අලුත්ගම් තොට, අංක 19/4 පදිංචි, සීරංග ආරච්චිලාගේ නාලින්ද කුමාර මාකෙහෙල්වල යන අය විසින් මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර හා මහ නගර සභා බල සීමාව තුළ, ධර්මරාජ මාවතේ උඩගම, අම්පිටිය පිහිටි, බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ද ලා. මොටේ විසින් සාදන ලද අංක 7363 සහ 1996 පෙබරවාරි මස 07 දිනැති පිඹුරේ අංක 4 දරන පට්ටියකැලේ එස්ටේට් හි කොටසක් වශයෙන් හඳුන්වනු ලබන, ඉඩම ඊසානට : ලොට් 3 ද, ගිනිකොණට : මු. පි. මහ 379 හි ලොට් 71, වරිපනම් අංක 29/74 සහ වරිපනම් අංක 29/104 දරන පරිශ්‍රයද, නිරිතට : මු. පි. මහ 379 හි ලොට් 68, වරිපනම් අංක 29/71, සහ 29/96 ද, වයඹට ඉහත කී පිඹුරේ ලොට් 5 ද, වන එකී පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහතුනකුත් (අ.0, රූ. 0, පර්. 13) වන එහි පිහිටි සියලුම දේ ද සමග වන ඉඩම් කොටස. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු ඒ. 275/218 හි ලියාපදිංචි වී ඇත.

තවද, මෙහි පහත දැක්වෙන ඉඩම මතින් සහ ඔස්සේ මාර්ග අයිතිවාසිකම ද සමග වේ. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගරය සහ මහනුවර මහ නගර සභා සීමාව ඇතුලත අම්පිටිය උඩගම, දැන් ධර්මරාජ මාවතේ පිහිටි "පට්ටිය කැලේ එස්ටේට්" හි කොටසක් වශයෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ඩී. ලා මොටේ විසින් සාදන ලද වර්ෂ 1996ක් වූ පෙබරවාරි මස 07 වැනි දිනැති අංක 7363 දරන පිඹුරේ ලොට් 6 වශයෙන් සලකුණු කර දක්වා ඇති මාර්ග රක්ෂිතය. එකී ලොට් 6ට මායිම්, උතුරට: ධර්මරාජ මාවත සහ ඉහත කී පිඹුරේ ලොට් 01 ද, නැගෙනහිරට ඉහත කී පිඹුරේ ලොට් 01 සහ ලොට් 03 ද, දකුණට: ලොට් 05 ද සහ බස්නාහිරට ලොට් 02 සහ ලොට් 05 ද වන එකී පිඹුරේ ලොට් 6 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 2.5)ක් වන ඉහත කී පිඹුරේ ලොට් 03 සහ ලොට් 04 ඔස්සේ මාර්ග අයිතිවාසිකම් සහ එහි පිහිටි සියලු දෙයද සමග වන ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 275/219 පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

නේෂන් ට්‍රස්ට් බැංකුවේ මා වෙත පවරා ඇති බලය මත 2007.12.28 වැනි දින පෙ. ව. 11.30ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රම.–*සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් කල ගෙවීම් මුදලින් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහය (ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව සහ ගැනුම් මිල මත අයවිය යුතු අනෙකුත් සියලු බදු සමග) වෙන්දේසියේ දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතුය.
2. ගැනුම් මිලෙන් සියයට එකක් ප්‍රාදේශීය සභා බදු ලෙස අදාල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය.
3. ගැනුම් මිලෙන් සියයට 2.5ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය.
4. බැංකුව විසින් දරන ලද සියළුම ප්‍රචාරණ සහ අනෙකුත් වියදම්
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් 500යි.
6. නොතාරිස් ගාස්තු රුපියල් 2500යි. (විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා).

හිමිකම් ඔප්පු සහ වෙනත් ලියවිලි කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 242 දරන ස්ථානයේ නේෂන් ට්‍රස්ට් බැංකුවේ දී පරීක්ෂා කර බැලිය හැක.

දුරකථනය අංකය : 4313158

එන්. ඩී. ඩී. සී. සේනානායක,
ට්‍රියැඩ් ඔක්ෂනියර්ස්.

අංක 155/1, දෙහිවල පාර,
බෙල්ලන්විල.
දුරකථන අංක : 2730962 - 2731317

12-149

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

**1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.**

(සැම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 445 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහ පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සැම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සැම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 0 |

(අඟලේ සැම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සැම සිකුරාදා දිනයකම "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය" පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සැම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සැම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | පිටරට |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ඡේදය | 520 0 | 1,007 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 0 |
| III වන ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ | තැපැල් ගාස්තුව (මෙරට) |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| (අ) | I වන කොටස | 31 0 | 5 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) | I වන ඡේදය | 10 0 | 5 0 |
| | II වන ඡේදය | 12 0 | 5 0 |
| | III වන ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.-* මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| දෙසැම්බර් | 2007.12.07 | සිකුරාදා | 2007.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.14 | සිකුරාදා | 2007.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.20 | බ්‍රහස්පතින්දා | 2007.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.28 | සිකුරාදා | 2007.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2008** | | | |
| ජනවාරි | 2008.01.04 | සිකුරාදා | 2007.12.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2008.01.11 | සිකුරාදා | 2007.12.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.01.18 | සිකුරාදා | 2008.01.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.01.25 | සිකුරාදා | 2008.01.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2008.02.01 | සිකුරාදා | 2008.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.08 | සිකුරාදා | 2008.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.15 | සිකුරාදා | 2008.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.22 | සිකුරාදා | 2008.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.29 | සිකුරාදා | 2008.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.